වාර්ෂික වාර්තාව
வருடாந்த அறிக்கை
Annual Report 2020



ජාතික ශිල්ප සභාව
தேசிய அருங்கலைகள் பேரவை
National Crafts Council

NCC

වේවැල්, පිත්තල, මැටි, ලී බඩු සහ ග්‍රාමීය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය

State Ministry of Rattan, Brass, Clay, Furniture and Rural Industry Promotion

பிரம்புகள், பித்தளை, மட்பாண்டங்கள், மரப்பொருட்கள் மற்றும் கிராமிய கைத்தொழில் மேம்பாட்டு இராஜாங்க அமைச்சு

හැඳින්වීම

ජාතික ශිල්ප සභාව

වසර දහස් ගණනක ප්‍රෞඪ ඉතිහාසයකට උරුමකම් කියන ශ්‍රී ලංකාව අත්කම් හා කලා ශිල්පයන්ගෙන් පරිපූර්ණ වූවකි. සංස්කෘතික දායාදයක් වූ අත්කම් පෝෂණය සඳහා පෙර රජ දවස රාජ්‍ය අනුග්‍රහය නොමදව ලැබිණ.අත්කම් නිර්මාණයන්හි නිරතවූ ශිල්පීන් හට සමාජය තුල සුවිශේෂී ස්ථානයක් හිමි වූ අතර, රාජ්‍ය ගෞරව සම්මානයන්ගෙන් පිදුම් ලැබීය.

ශ්‍රී ලංකාව දේශීය ආධිපත්‍යයට නතු වීමෙන් පසු වසර දහස් ගණනක් පාරම්පරිකව ආරක්ෂා කරගනිමින් පෝෂණය කළ අත්කම් නිර්මාණ, ශිල්පීය ක්‍රම සහ කුසලතා රාජ්‍ය අනුග්‍රහය නොලැබීමත්, ඇගයීමකට ලක් නොවීමත් හේතු කොටගෙන ක්‍රම ක්‍රමයෙන් විනාශ වී යන්නට විය. ශ්‍රී ලංකාව නිදහස ලැබීමත් සමඟ හස්ත කර්මාන්තයන්හි නැවත පුනර්ජීවනයක් ඇති වූ අතර, ඒ සඳහා රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතනයන් ද බිහි විය.

හස්ත කර්මාන්ත සංරක්ෂණය සහ සංවර්ධනය මෙන්ම හස්ත කර්මාන්ත ක්ෂේත්‍රයේ නියුතු ශිල්පීන්ගේ ආර්ථික හා සමාජ තත්ත්වයන් නංවාලීම ප්‍රධාන අරමුණ කොට 1982 අංක 35 දරණ ජාතික ශිල්ප සභා සහ අනුබද්ධිත ආයතන පනත යටතේ ජාතික ශිල්ප සභාව ස්ථාපිත විය.

පසුගිය දශක කිහිපය තුළ ජාතික ශිල්ප සභාව විසින් හස්ත කර්මාන්ත සංරක්ෂණය, සංවර්ධනය සහ හස්ත කර්මාන්ත ශිල්පීන්ගේ සුභ සාධනය වෙනුවෙන් විවිධ ව්‍යාපෘතීන් හා වැඩසටහන් රාශියක් ක්‍රියාත්මක කර ඇත.

දර්ශනය

තිරසාර පැවැත්ම උදෙසා හෙළ අත්කම් පෝෂණය කිරීම හා සංරක්ෂණය කිරීම.

මෙහෙවර

සාම්ප්‍රදායික සහ සංස්කෘතික වටිනාකමක් ඇති දේශීය හස්ත කර්මාන්ත සංරක්ෂණය කිරීම, සංවර්ධනය කිරීම, දිරි ගැන්වීම, ප්‍රවර්ධනය කිරීම සහ ශිල්පීන්ගේ ආර්ථික හා සමාජයීය තත්ත්වය නංවාලීම.

පරමාර්ථ

- හස්ත කර්මාන්ත ශිල්පීන්ගේ ආදායම ඉහල නැංවීම
- නිෂ්පාදන ධාරිතාව වැඩි කිරීම
- සේවානියුක්තිකයින්ගේ හා ශිල්පීන්ගේ කාර්යක්ෂමතාව ඉහල නැංවීම
- හස්ත කර්මාන්ත ශිල්පීන්ගේ මූල්‍ය තත්ත්වය ශක්තිමත් කිරීම
- දල දේශීය නිෂ්පාදිතයට හස්ත කර්මාන්ත ක්ෂේත්‍රයේ දායකත්වය වැඩි කිරීම
- හස්ත කර්මාන්ත ක්ෂේත්‍රය ආශ්‍රිත පුහුණු ආධුනිකයින් බිහිකිරීම

අරමුණු

- ස්වයං රැකියා ජනිත කිරීම සහ හස්ත කර්මාන්ත ශිල්පීන් සඳහා සහායක සේවා සැපයීම
- හස්ත කර්මාන්ත ශිල්පීන්ට අවශ්‍ය යෝග්‍ය තාක්ෂණය ලබා දීම
- ආධුනිකයින් සඳහා පුහුණු පහසුකම් ලබා දීම
- හස්ත කර්මාන්ත ශිල්පීන් සඳහා සහණදායී ණය පහසුකම් ලබා දීම
- සේවානියුක්තිකයින්ගේ හා ශිල්පීන්ගේ කාර්යක්ෂමතාව ඉහල නැංවීම
- අළෙවි පහසුකම් ලබා දීම තුලින් ශිල්පීන්ගේ ආදායම ඉහල නැංවීම

...පටුන...

පිටු අංකය

***හැඳින්වීම..... 01**

***දර්ශනය, මෙහෙවර..... 01**

***පරමාර්ථ සහ අරමුණු..... 02**

1. සාරාංශගත ප්‍රගතිය..... 05 – 06

2. ජාතික ශිල්ප සභාවේ ආයතනික කටයුතු..... 07

2.1. අධ්‍යක්ෂ මණ්ඩලය - 2020..... 08

2.2. අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්..... 08

2.3. ජාතික ශිල්ප සභාවේ කළමනාකාරීත්වය..... 08

2.4. පළාත් සම්බන්ධීකරණ කටයුතු කළමනාකරණය..... 09

2.5. බැංකු..... 09

2.6. විගණකවරු..... 09

2.7. ජාතික ශිල්ප සභාවේ අනුමත සේවක සංඛ්‍යාව කළමනාකරණ, සංවිධාන ව්‍යුහය සහ සභාය කාර්ය මණ්ඩලය..... 09 – 15

*** ජාතික ශිල්ප සභාවේ කාර්යාල ලිපිනයන්..... 16 – 17**

***1982 අංක 35 දරණ ජාතික ශිල්ප සභා සහ අනුබද්ධ ආයතන පනත අනුව (17 වැනි පරිච්ඡේදය) ජාතික ශිල්ප සභාව වෙත පවරා ඇති බලතල සහ කාර්යයන්..... 18**

*** ජාතික ශිල්ප සභාවේ වැඩසටහන් හා ක්‍රියාමාර්ග..... 19**

*** ජාතික ශිල්ප සභාව මගින් අනුග්‍රහය ලබන හස්ත කර්මාන්ත ක්ෂේත්‍ර..... 20**

3. ජාතික ශිල්ප සභාවේ සංවර්ධන කාර්යයභාරය..... 21

3.1. අමුද්‍රව්‍ය කළමණාකරණ වැඩසටහන..... 22 – 23

3.2. හස්ත කර්මාන්ත ශිල්පීන් ලියාපදිංචි කිරීම, හැඳුනුම්පත් නිකුත් කිරීම සහ වෙබ් අඩවිය යාවත්කාලීන කිරීම..... 24

3.3. දත්ත පද්ධතිය ස්ථාපිත කිරීම..... 24

3.4. ශිල්ප සුභසාධන වැඩසටහන..... 25

පිටු අංකය

3.5.	ස්වයං රැකියා ආරම්භ කිරීම සඳහා යන්ත්‍ර සූත්‍ර, උපකරණ, මෙවලම් සහ අමුද්‍රව්‍ය ලබා දීම.....	25
3.6.	"ගම්බිම් - වැඩබිම්" බවට පත්කිරීමේ හස්ත කර්මාන්ත ගම්මාන සංවර්ධන වැඩසටහන.....	26 – 27
3.7.	නව තාක්ෂණය හඳුන්වා දීම.....	27
3.8.	හස්ත කර්මාන්ත පුහුණු ව්‍යාපෘතිය සහ විශේෂ පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.....	28
3.9.	පුහුණු මධ්‍යස්ථාන වැඩිදියුණු කිරීම සහ අලුත්වැඩියා කිරීම.....	29 – 30
3.10.	හස්ත කර්මාන්ත නිෂ්පාදන සහ අළෙවි ගම්මාන ස්ථාපිත කිරීම සහ වැඩිදියුණු කිරීම.....	31
3.11.	දේශීය අළෙවි ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.....	31 – 33
3.12.	විදේශීය අළෙවි ප්‍රවර්ධන සහ පුහුණු වැඩසටහන් සඳහා සහභාගී වීම.....	34
3.13.	මානව සම්පත් සංවර්ධන වැඩසටහන.....	35
4.	**මූල්‍ය කාර්යය සාධනය - 2020.....**	**36 – 72**
5.	**විගණකාධිපති වාර්තාව - 2020.....**	**73 - 82**

01) සාරාංශගත ප්‍රගතිය

සාරාංශගත ප්‍රගතිය - 2020

	වැඩසටහන/ක්‍රියාකාරකම	ප්‍රගතිය
1	**අමුද්‍රව්‍ය කළමණාකරණ වැඩසටහන ක්‍රියාත්මක කිරීම**	
	වගා කල පැළ සංඛ්‍යාව	9588
	ප්‍රතිලාභී ශිල්පීන් සංඛ්‍යාව (පිත්තල සහ රිදී,අමුද්‍රව්‍ය, දැව බලපත්‍ර)	180
2	**හස්ත කර්මාන්ත ශිල්පීන් ලියාපදිංචි කිරීම, හැඳුනුම්පත් නිකුත් කිරීම සහ වෙබ් අඩවිය යාවත්කාලීන කිරීම**	
	ලියාපදිංචි කරන ලද හස්ත කර්මාන්ත ශිල්පීන් සංඛ්‍යාව	2894
3	**දත්ත පද්ධතිය ස්ථාපිත කිරීම**	
	නිර්මාණය කරන ලද දත්ත පද්ධති සංඛ්‍යාව	01
4	**ශිල්ප සුභ සාධන වැඩසටහන**	
	ප්‍රතිලාභී ශිල්පීන් සංඛ්‍යාව	41
5	**ස්වයං රැකියා ආරම්භ කිරීම සඳහා යන්ත්‍ර සූත්‍ර, උපකරණ, මෙවලම් සහ අමුද්‍රව්‍ය ලබා දීම**	
	ජනිත කරන ලද ස්වයං රැකියා ප්‍රමාණය	570
6	**"ගම්බිම් - වැඩබිම්" බවට පත්කිරීමේ හස්ත කර්මාන්ත ගම්මාන සංවර්ධන වැඩසටහන**	
	සංවර්ධනය කරනු ලැබූ ගම්මාන සංඛ්‍යාව	04
7	**නව තාක්ෂණය හඳුන්වා දීම**	
	ප්‍රතිලාභී ශිල්පීන් සංඛ්‍යාව	20
	හඳුන්වාදුන් නව යන්ත්‍ර සංඛ්‍යාව	02
8	**හස්ත කර්මාන්ත පුහුණු ව්‍යාපෘතිය සහ විශේෂ පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම**	
	පුහුණුව ලැබූ ආධුනික සංඛ්‍යාව	517
9	**පුහුණු මධ්‍යස්ථාන වැඩිදියුණු කිරීම සහ අලුත්වැඩියා කිරීම**	
	වැඩිදියුණු කරන ලද පුහුණු මධ්‍යස්ථාන සංඛ්‍යාව	08
10	**හස්ත කර්මාන්ත නිෂ්පාදන සහ අළෙවි ගම්මාන ස්ථාපිත කිරීම සහ වැඩිදියුණු කිරීම**	
	ස්ථාපිත සහ වැඩිදියුණු කරන ලද ගම්මාන සංඛ්‍යාව	01
11	**දේශීය අළෙවි ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම**	
	සහභාගී වූ / ප්‍රතිලාභී ශිල්පීන් සංඛ්‍යාව	529
	සංවිධානය කරන ලද දේශීය අළෙවි ප්‍රවර්ධන වැඩසටහන් සංඛ්‍යාව	04
	අළෙවි වටිනාකම (රු. මි.)	15.72
12	**විදේශීය අළෙවි ප්‍රවර්ධන සහ පුහුණු වැඩසටහන් සඳහා සහභාගී වීම**	
	අළෙවිකරණ පහසුකම් ලද හස්ත කර්මාන්ත ශිල්පීන් සංඛ්‍යාව	08
	අළෙවි වටිනාකම (රු. මි.)	0.702
	සහභාගී වූ අළෙවි ප්‍රවර්ධන සහ පුහුණු වැඩසටහන් සංඛ්‍යාව	01
13	**මානව සම්පත් සංවර්ධන වැඩසටහන**	
	පුහුණුව ලබා දුන් සේවක සංඛ්‍යාව	56

02) ජාතික ශිල්ප සභාවේ ආයතනික කටයුතු

2.1. අධ්‍යක්ෂ මණ්ඩලය - 2020

1. සුදත් අබේසේකර මහතා - සභාපති
2. ඒ.ලක්කදාස් මහතා - සාමාජික (2020.12.07 දින සිට)
3. ඒ.කේ.ආර්. අලවත්ත මහතා - සාමාජික (2020.12.06 දින දක්වා)
4. කේ.ඒ.එස්.එස්.කේ. පෙරේරා මහතා - සාමාජික
5. එල්.එච්. රම්‍යසිරි මහතා - සාමාජික (2020.06.10 සිට 2020.06.09 දිනදක්වා)
6. අනෝජා පී.ගුරුගේ මිය - සාමාජික (2020.06.10 දින සිට)
7. ආචාර්ය ජේ.කේ.ආර්. ආර්. සමරසේකර මිය - සාමාජික
8. අජිත් ජයවර්ධන මහතා - සාමාජික
9. සුජීව එස්. පල්ලියගුරුගේ මහතා - සාමාජික (2020.01.17 සිට 2020.07.29 දක්වා)
10. ප්‍රදීප් ගුණවර්ධන මහතා - සාමාජික (2020.11.16 දින සිට)
11. සුධීර ජයරත්න මහතා - සාමාජික
12. ඒ.ජී.එස්.කේ. අලුත්වත්ත මහතා - සාමාජික
13. වජිර රණසිංහ මහතා - සාමාජික
14. ඩී.ඒ.චාමික ප්‍රසාද් මහතා - සාමාජික
15. ආර්.එච්. රංජිත් උපාලි මහතා - සාමාජික
16. පී.හේවාගමගේ මහතා - සාමාජික
17. ප්‍රසන්න බුද්ධික හේරත් මහතා - සාමාජික (2020.02.26 දින සිට)
18. එම්.ඒ. මලිඳු ලක්ෂාන් මහතා - සාමාජික (2020.02.26 දින සිට)

2.2. අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්

2020 වර්ෂය තුල දී ජාතික ශිල්ප සභාවේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් 04ක් පවත්වා ඇත.

- 2020 පෙබරවාරි මස 27 වන දින
- 2020 ජූනි මස 11 වන දින
- 2020 ජූලි 29 වන දින
- 2020 නොවැම්බර් මස 20 වන දින

2.3. ජාතික ශිල්ප සභාවේ කළමනාකාරීත්වය

- අධ්‍යක්ෂ
- සහකාර / නියෝජ්‍ය අධ්‍යක්ෂ (පාලන)
- සහකාර / නියෝජ්‍ය අධ්‍යක්ෂ (හස්ත කර්මාන්ත පුහුණු ව්‍යාපෘතිය)
- නියෝජ්‍ය අධ්‍යක්ෂ (සංවර්ධන)
- ගණකාධිකාරී
- අභ්‍යන්තර විගණන නිළධාරී
- සහකාර අධ්‍යක්ෂ (සංවර්ධන)
- සහකාර අධ්‍යක්ෂ (සැලසුම්)
- සහකාර අධ්‍යක්ෂ (පළාත්)

2.4. පළාත් සම්බන්ධීකරණ කටයුතු කළමනාකරණය

ජාතික ශිල්ප සභාවේ ක්‍රියාකාරකම් දිවයින පුරා කාර්යක්ෂමව හා විධිමත් පරිදි දීප ව්‍යාප්ත කිරීම සඳහා පළාත් මට්ටමින් පළාත් කර්මාන්ත අමාත්‍යාංශ හා ඒකාබද්ධව අදාල සම්බන්ධීකරණ කටයුතු දියත් කිරීමට එම පළාත් සඳහා සෘජුවම වගකීම සඳහා පළාත් සහකාර අධ්‍යක්ෂවරුන් හා සංවර්ධන සහකාරවරුන් ඒ ඒ පළාත් මට්ටමින් සහ දිස්ත්‍රික් මට්ටමින් අනුයුක්ත කර ඇත.

2.5. බැංකු

- ලංකා බැංකුව - පැලවත්ත ශාඛාව, බත්තරමුල්ල
- මහජන බැංකුව - බත්තරමුල්ල

2.6. විගණකවරු

ජාතික ශිල්ප සභාවේ විගණනය විගණකාධිපතිවරයා විසින් සිදුකරනු ලබයි.

2.7. ජාතික ශිල්ප සභාවේ අනුමත සේවක සංඛ්‍යාව කළමනාකරණ, සංවිධාන ව්‍යුහය සහ සහාය කාර්ය මණ්ඩලය

තනතුර	සංඛ්‍යාව
අධ්‍යක්ෂ	01
සහකාර / නියෝජ්‍ය අධ්‍යක්ෂ (පාලන)	01
සහකාර / නියෝජ්‍ය අධ්‍යක්ෂ (හස්ත කර්මාන්ත පුහුණු ව්‍යාපෘතිය)	02
නියෝජ්‍ය අධ්‍යක්ෂ (සංවර්ධන)	01
ගණකාධිකාරී	01
අභ්‍යන්තර විගණන නිළධාරී	01
සහකාර අධ්‍යක්ෂ (සංවර්ධන)	03
සහකාර අධ්‍යක්ෂ (සැලසුම්)	01
සහකාර අධ්‍යක්ෂ (පළාත්)	09
ගිණුම් සහ ප්‍රසම්පාදන නිළධාරී	01
පරිපාලන නිළධාරී	01
සංවර්ධන සහකාර	35
මූල්‍ය සහකාර	01
අලෙවි සහකාර	01
පාලන සහකාර	01
සංවර්ධන සහකාර (තොරතුරු තාක්ෂණ)	01
ප්‍රදර්ශක	112
හස්ත කර්මාන්ත ව්‍යාප්ති සහකාර	25
කළමනාකරණ සහකාර	43
රියදුරු	08
විදුලි කාර්මික	01
කාර්යාල සහයක	09
කම්කරු	01
මුරකරු	02
එකතුව	**262**


Organizational Structure - National Crafts Council
Chairman / Board of Directors
Director
HM 1-3
Deputy Director (handicraft Training Project)
MM 1-3
Deputy Director (Admn)
MM 1-3
Deputy Director (Dev)
MM 1-3
Asst. Director
MM 1-1
Admn Officer
JM 1-1
Asst. Director
Province)
MM 1-1
Asst. Director
(Dev)
MM 1- 1
Asst. Director
(Planning)
MM 1-1
Accountant
MM 1 -1
Internal Auditor
MM 1-1
Accounts &
Procurement Officer
JM 1-1
Development Asst
MA 3
Financial Asst.
(Under the Supervision
of Acct)
MA 3
Administrative Asst.
(Under the Supervision
of DD/A)
MA 3
Development Asst.
MA 3
Marketing Asst
MA 3
Development Asst (IT)
MA 3
Mgt. Asst
MA 1-2
Mgt. Asst.
MA 1-2
Mgt. Asst
MA 1-2
Mgt. Ast
MA 1-2
Mgt. Asst.
MA 1-2
Mgt. Asst
MA 1-2
Mgt.Asst
MA 1-2
Mgt. Asst.
MA 1-2
Mgt. Asst
MA 1-2
Handicrafts
Extension Asst
Demonstrator /
Handicrafts Instructor
MA 1-2
Electrician
Driver
PL 1-3
Un Skilled
PL 1-1
Un Skilled
PL 1-1
Un Skilled
PL 1-1
Un Skilled
PL 1-1
Un Skilled
PL 1-1
Un Skilled
PL 1-1

2020.12.31 දින ජාතික ශිල්ප සභාවේ කාර්ය මණ්ඩලය

	<u>නම</u>	<u>තනතුර</u>
1.	චන්ද්‍රමාලි ලියනගේ මිය	අධ්‍යක්ෂ
2.	එන්.එච්.ජේ. ද සිල්වා මෙය	සහකාර අධ්‍යක්ෂ (පාලන)
3.	එච්.එම්.එස්.කේ.ගුණතිලක මහතා	සහකාර අධ්‍යක්ෂ (සංවර්ධන)
4.	කේ.ජී.එස්.කහන්ගම මහතා	සහකාර අධ්‍යක්ෂ (සංවර්ධන)
5.	ඒස්.අයි.එම්. රියාස් මහතා	සහකාර අධ්‍යක්ෂ (සංවර්ධන)
6.	ඕ.ජේ.කේලන්තොටුවගේ මහතා	සහකාර අධ්‍යක්ෂ (සැලසුම්)
7.	පී.ඩබ්.එස්.කුමාර මහතා	ගණකාධිකාරි
8.	සී.ඒ.ඩී.එන්.එස්.කොල්ලුරේ මිය	අභ්‍යන්තර විගණන නිළධාරී
9.	පී.ඒ.ජයසිංහ මහතා	සහකාර අධ්‍යක්ෂ (පුහුණු)
10.	ජයන්ති ලේකම්ගේ මිය	සහකාර අධ්‍යක්ෂ(පුහුණු)
11.	එන්.එල්.ගුණසිංහ මහත්මිය	සහකාර අධ්‍යක්ෂ (පළාත්)
12.	එස්.එම්.ඒ.එස්. බණ්ඩාර මහතා	සහකාර අධ්‍යක්ෂ (පළාත්)
13.	කේ.එම්.ජී.කමල් මහතා	සහකාර අධ්‍යක්ෂ (පළාත්)
14.	එස්.ඩී.ආර්.කේ.සමරසිංහ මහතා	සහකාර අධ්‍යක්ෂ (පළාත්)
15.	ඩබ්ලිව්.ජී.එන්.යූ.විජයලත් මහතා	සහකාර අධ්‍යක්ෂ (පළාත්)
16.	ඩබ්.කේ.එන්. ශ්‍යාමලී මහත්මිය	සහකාර අධ්‍යක්ෂ (පළාත්)
17.	එම්.එම්.එච්.ජී.සමරනායක මහතා	සහකාර අධ්‍යක්ෂ (පළාත්)
18.	පී.ආර්.එම්.ආර්.එස්.කේ.පල්ලේපොල මහතා	සහකාර අධ්‍යක්ෂ(පළාත්)
19.	එම්.එල්.නිශාන්ත රෝහන ඩයස් මහතා	පරිපාලන නිලධාරි
20.	බී.එල්.ඩී.ටී.ඩී.කුලරත්න මෙය	මූල්‍ය සහකාර
21.	කේ.අයි.ඒ.ඒස්.කේ. සුගන්ධි මෙය	අලෙවි සහකාර
22.	එස්.ඩබ්.පියසාර මහතා	සංවර්ධන සහකාර
23.	එම්.යූ.ඒ.ඇල්ලේගෙදර මහත්මිය	සංවර්ධන සහකාර
24.	එම්.එස්.කළුආරච්චි මහත්මිය	සංවර්ධන සහකාර
25.	බී.එන්.උදය කුමාර මහතා	සංවර්ධන සහකාර
26.	කේ.පොන්කරන් මහතා	සංවර්ධන සහකාර
27.	බී.කේ.ජී.චන්ද්‍රිකා මහත්මිය	සංවර්ධන සහකාර
28.	කේ.ජී.රුවන් සම්පත් වර්ණසිරි මහතා	සංවර්ධන සහකාර
29.	එස්.එම්.එස්.බී.සමරකෝන් මහතා	සංවර්ධන සහකාර
30.	එස්.ලෝගප්‍රකාශ් මහතා	සංවර්ධන සහකාර
31.	කේ.එම්.ටී.ටී. කුලතුංග මහත්මිය	සංවර්ධන සහකාර
32.	ඩබ්.ඩබ්. දමිත නිරෝෂන මහතා	සංවර්ධන සහකාර
33.	ඒ.ඒ.ඒ. අධිකාරි මහතා	සංවර්ධන සහකාර
34.	ඩී.ඩී.මධුෂාන් මහතා	සංවර්ධන සහකාර
35.	එස්.බී. වනිගතුංග මහතා	සංවර්ධන සහකාර
36.	ජී.අයි.එස්. ප්‍රේමචන්ද්‍ර මිය	සංවර්ධන සහකාර
37.	ආර්.ඒ.එස්.ජයකාන්ති මිය	කළමණාකරණ සහකාර
38.	එල්.ඩබ්ලිව්.ඒ.ඒ. පුෂ්පකාන්ති මහත්මිය	කළමණාකරණ සහකාර
39.	එච්.ඒ.කමල් මහතා	කළමණාකරණ සහකාර

	නම	තනතුර
40.	ඒ.එච්.ජයසිංහ මහතා	කළමණාකරණ සහකාර
41.	පී.එල්.චන්ද්‍රලතා මහත්මිය	කළමණාකරණ සහකාර
42.	එම්.ඩී.වේලාරත්න මහත්මිය	කළමණාකරණ සහකාර
43.	ඩී.සී.ආර්.ඩී.ජයසූරිය මහතා	කළමණාකරණ සහකාර
44.	ජී.ඒ.එච්. ද සිල්වා මිය	කළමණාකරණ සහකාර
45.	තරංගා මධුෂාණි මහත්මිය	කළමණාකරණ සහකාර
46.	එච්.ආර්.ඒ.වසන්ත කුමාර මයා	කළමණාකරන සහකාර
47.	එච්.එම්.රෝහිණී කුමාරි මහත්මිය	කළමණාකරන සහකාර
48.	යූ.ඩී.යමුනා කාන්ති මහත්මිය	කළමණාකරන සහකාර
49.	එම්.ඩී.ලලිතා මෙය	කළමණාකරන සහකාර
50.	එච්. එස්.සි.රණතුංග මහතා	කළමණාකරන සහකාර
51.	ආර්.ඩී.එන්.ඒ.එන්. පෙතියාගොඩ මහත්මිය	කළමණාකරන සහකාර
52.	ලක්ෂිතා විමලසිරි මිය	කළමණාකරන සහකාර
53.	වයි.ජී.කුමුදුනී මාලා මහත්මිය	කළමණාකරන සහකාර
54.	බී.ඉන්ද්‍රානි මහත්මිය	කළමණාකරන සහකාර
55.	බි.ආර්.එම්.එන්.රත්නායක මහත්මිය	කළමණාකරන සහකාර
56.	සුගන්ධිකා ජයසුන්දර මහත්මිය	කළමණාකරන සහකාර
57.	නිශාන්ති වීරක්කොඩි පෙරේරා මිය	කළමණාකරන සහකාර
58.	එන්.ඒ.එන්. ඉරේෂා නාරංගොඩ මහත්මිය	කළමණාකරන සහකාර
59.	ඩබ්.ඉන්ද්‍රානි මහත්මිය	කළමණාකරන සහකාර
60.	පී.ජී. මානෙල් ශ්‍රියාලතා මහත්මිය	කළමණාකරන සහකාර
61.	සී.එස්.හෙට්ටිහේවා මෙනවිය	කළමණාකරන සහකාර
62.	අයි.ටී.ඩී. සමරක්කොඩි මහත්මිය	කළමණාකරන සහකාර
63.	එච්.එම්.ජී.පි. ගුණතිලක මහත්මිය	කළමණාකරන සහකාර
64.	එම්.ඩී. නුවන් බුද්ධික මහතා	කළමණාකරන සහකාර
65.	ඒ.ඒම්. හෙට්ටිආරච්චි මෙය	කළමණාකරන සහකාර
66.	ඩබ්.පී.සී.එච්.කේ. විජේසිංහ මෙය	කළමණාකරන සහකාර
67.	ඩී.එම්. නිසංසලා කුමුදිනි දිසානායක මිය	කළමණාකරන සහකාර
68.	පියුමි මධුෂානි මෙනවිය	හස්ත කර්මාන්ත ව්‍යාප්ති සහකාර
69.	එල්.එස්.යූ.නාරංගොඩ මහතා	හස්ත කර්මාන්ත ව්‍යාප්ති සහකාර
70.	දිල්හානි දාබරේ මෙනවිය	හස්ත කර්මාන්ත ව්‍යාප්ති සහකාර
71.	කේ.මල්මරුහන් මහතා	හස්ත කර්මාන්ත ව්‍යාප්ති සහකාර
72.	පී.ආර්.කුමාරසිංහ මහතා	හස්ත කර්මාන්ත ව්‍යාප්ති සහකාර
73.	ඉසංකා මධුෂානි මහත්මිය	හස්ත කර්මාන්ත ව්‍යාප්ති සහකාර
74.	එස්.සසිකරන් මහතා	හස්ත කර්මාන්ත ව්‍යාප්ති සහකාර
75.	ඉන්දික අරුණසිරි හාරිස්පත්තුව මහතා	හස්ත කර්මාන්ත ව්‍යාප්ති සහකාර
76.	ආර්.එස්.ටී.රත්නායක මහතා	හස්ත කර්මාන්ත ව්‍යාප්ති සහකාර
77.	ජේ.විජයලත් මහතා	හස්ත කර්මාන්ත ව්‍යාප්ති සහකාර
78.	එච්.ඩබ්.කේ.ශෂි ප්‍රභාත් මහතා	හස්ත කර්මාන්ත ව්‍යාප්ති සහකාර
79.	එම්.ඒ.එන්.පී.කරුණාරත්න මහතා	හස්ත කර්මාන්ත ව්‍යාප්ති සහකාර
80.	නිමන්ති විජේරත්න මහත්මිය	හස්ත කර්මාන්ත ව්‍යාප්ති සහකාර

	නම	තනතුර
81.	එල්.ඒ.එල්.සී.කේ.ලියනගේ මෙනවිය	හස්ත කර්මාන්ත ව්‍යාප්ති සහකාර
82.	මින්දිකා ආරියරත්න මෙනවිය	හස්ත කර්මාන්ත ව්‍යාප්ති සහකාර
83.	එච්.පී.සී. කල්දේරා මහත්මිය	හස්ත කර්මාන්ත ව්‍යාප්ති සහකාර
84.	එන්.ඊ.එම්. සී. රසාංජලී ඒකනායක මෙය	හස්ත කර්මාන්ත ව්‍යාප්ති සහකාර
85.	එස්.ජේ.ජී.ජී. සිරිවර්ධන මහතා	හස්ත කර්මාන්ත ව්‍යාප්ති සහකාර
86.	කේ.ජී.පී.චන්දිමාල් දේශපිය මයා	හස්ත කර්මාන්ත ව්‍යාප්ති සහකාර
87.	ආර්.එම්.එච්.රඹුක්වැල්ල මිය	හස්ත කර්මාන්ත ව්‍යාප්ති සහකාර
88.	එම්.පී. අනුරුද්ධ නේලංග පියදාස මයා	හස්ත කර්මාන්ත ව්‍යාප්ති සහකාර
89.	එම්.ආර්.එස්.පීරිස් මහතා	ශිල්පිය අධීක්ෂක
90.	ආර්.ජී. ආරියරත්න මහතා	ශිල්පිය අධීක්ෂක
91.	එච්.එම්.වයි.ජී. විමලරත්න බණ්ඩා හේරත් මහතා	ශිල්පිය අධීක්ෂක
92.	ටී.එම්.ජී.තෙන්නකෝන් මහතා	ප්‍රදර්ශක
93.	ඩබ්.ඒ.විමල් රංජිත් මහතා	ප්‍රදර්ශක
94.	ජේ.එම්.එස්.කේ. ජයසුන්දර මහත්මිය	ප්‍රදර්ශිකා
95.	ආර්.ඩී.විමලා විජයසිරි මහත්මිය	ප්‍රදර්ශිකා
96.	පී.ඒ.වී.ජේ.අල්විස් මහත්මිය	ප්‍රදර්ශිකා
97.	ආර්.කේ.එල්.එන්.රාජකරුණා මහතා	ප්‍රදර්ශක
98.	ඩබ්.ජී.ප්‍රියානි වෙදගෙදර මහත්මිය	ප්‍රදර්ශිකා
99.	ජී.වි. අමිතා මෙනවිය	ප්‍රදර්ශිකා
100.	ඩබ්.චන්ද්‍රානි මහත්මිය	ප්‍රදර්ශිකා
101.	යූ.ඩී.සී.මල්කාන්ති මහත්මිය	ප්‍රදර්ශිකා
102.	ජේ.එම්.එස්. මල්ලිකා මහත්මිය	ප්‍රදර්ශිකා
103.	ජී.සී. දමයන්ති මහත්මිය	ප්‍රදර්ශිකා
104.	සී.පාක්‍යාරානි මහත්මිය	ප්‍රදර්ශිකා
105.	ජී.ජී.එස්. ගුණවර්ධන මහත්මිය	ප්‍රදර්ශිකා
106.	පී.අයි.එච්. ජයතුංග මහත්මිය	ප්‍රදර්ශිකා
107.	බී.ඒ.ජී.ඥාණවතී මහත්මිය	ප්‍රදර්ශිකා
108.	ඒ.එම්.එස්.පී.සිරිසේන මහත්මිය	ප්‍රදර්ශිකා
109.	මාලනී ජෑන්ස් මහත්මිය	ප්‍රදර්ශිකා
110.	ඩබ්.ජී.එම්.එල්. ආරියකල්‍යාණි මහත්මිය	ප්‍රදර්ශිකා
111.	එන්.ඊ.ජී. ඉන්ද්‍රානි මහත්මිය	ප්‍රදර්ශිකා
112.	පී.ඩී.බුද්ධිකා ශ්‍රියාංගනී කුමාරි මහත්මිය	ප්‍රදර්ශිකා
113.	ඩබ්.සෙල්වරාණි මහත්මිය	ප්‍රදර්ශිකා
114.	පී.ජී.ජේ විජේරත්න මහතා	ප්‍රදර්ශක
115.	එම්.ඒ.එන්.පී. අනුරාධා මහත්මිය	ප්‍රදර්ශිකා
116.	සී.එස්.කේ. රණසිංහ මහත්මිය	ප්‍රදර්ශිකා
117.	ඒ.එම්.පී.මහින්දසිරි මහතා	ප්‍රදර්ශිකා
118.	කල්‍යාණි විතානවසම් මහත්මිය	ප්‍රදර්ශිකා
119.	ජයන්ති එච්. ගමගේ මිය	ප්‍රදර්ශිකා
120.	ඩබ්.ජී.ටී.එස්.එන්.කාන්ති මිය	ප්‍රදර්ශිකා
121.	පී.එම්.ස්වර්ණලතා පතිරාජ මිය	ප්‍රදර්ශිකා

	නම	තනතුර
122.	එච්.එම්.බී.එස්.එන්. නවරත්න මිය	ප්‍රදර්ශිකා
123.	පී.නිලන්ති කුමාරසිංහ මිය	ප්‍රදර්ශිකා
124.	ආර්.ඒ.චන්ද්‍රා රණසිංහ මිය	ප්‍රදර්ශිකා
125.	පී.ජී.ආර්.ඒ.ප්‍රියදර්ශනී කරුණාරත්න මිය	ප්‍රදර්ශිකා
126.	බී.කේ. වසන්තා කුමාරි මිය	ප්‍රදර්ශිකා
127.	ටී.ජී. වසන්තා විජේරත්න මිය	ප්‍රදර්ශක
128.	ජී.ජී. ඉන්ද්‍රකාන්ති මහත්මිය	ප්‍රදර්ශිකා
129.	බී.එම්.එස්.කේ. බස්නායක මිය	ප්‍රදර්ශිකා
130.	ආර්.එච්.චින්තා ශාන්තිලතා මිය	ප්‍රදර්ශිකා
131.	ඩබ්.කේ.ඩී.මහේෂිණී මිය	ප්‍රදර්ශිකා
132.	එච්.ජී.ජේ.භද්‍රානි මිය	ප්‍රදර්ශිකා
133.	එම්.පී.ජී.ටෙක්ෂි සුනේත්‍රා මිය	ප්‍රදර්ශිකා
134.	ආර්.චන්ද්‍රලතා මිය	ප්‍රදර්ශිකා
135.	එච්.ඒ.ශ්‍රියානි පුෂ්පලතා මිය	ප්‍රදර්ශිකා
136.	ඩී.එම්.ශ්‍රියානි දසනායක මිය	ප්‍රදර්ශිකා
137.	එච්.එච්.ඉන්ද්‍රා මිය	ප්‍රදර්ශිකා
138.	කේ.චාමලී ප්‍රියන්තා මිය	ප්‍රදර්ශිකා
139.	ඩබ්.පී.ජී.ඩබ්.එන්.ඊ.බී.ඒ.ද සොයිසා මිය	ප්‍රදර්ශිකා
140.	එම්.වී.ඩී.අයි.ගිම්හානි මෙය	ප්‍රදර්ශිකා
141.	එම්.සුබයිරත්තම්මා මිය	ප්‍රදර්ශිකා
142.	ඕ.ජී.කමලා නිශානි මිය	ප්‍රදර්ශිකා
143.	එච්.එන්.දිස්නා ප්‍රියංගනී මිය	ප්‍රදර්ශිකා
144.	පී.තිලකාවතී මෙය	ප්‍රදර්ශිකා
145.	එස්.පී.රංජනී ප්‍රියන්තා මිය	ප්‍රදර්ශිකා
146.	කේ.ඒ.නදීකා දර්ශනී කුමාරි මෙය	ප්‍රදර්ශිකා
147.	ඩබ්.එන්.ඩබ්.පී.එම්.නන්දා මාලනී මිය	ප්‍රදර්ශිකා
148.	ඩී.එම්.ඉන්ද්‍රානි ජයතිලක මිය	ප්‍රදර්ශිකා
149.	ඩී.ආර්.එන්.සංජීවනි දිසානායක මිය	ප්‍රදර්ශිකා
150.	මේනකා මහාලිංගම් මිය	ප්‍රදර්ශිකා
151.	ආර්.කේ.කේ.වික්‍රමසිංහ මිය	ප්‍රදර්ශිකා
152.	ඩබ්.එම්.ඩී.එම්.වික්‍රමසිංහ මහතා	ප්‍රදර්ශිකා
153.	එම්.පී.ජී.ඩයනා මිය	ප්‍රදර්ශිකා
154.	යූ.එච්.එන්.සිල්වා	ප්‍රදර්ශිකා
155.	එන්.බී.එන්.ඩී.බන්ඩාරනායක	ප්‍රදර්ශිකා
156.	කේ.නිපුණිකා වැලිගල්ල මිය	ප්‍රදර්ශිකා
157.	එච්.එම්.ඩී.බී.මැණිකේ	ප්‍රදර්ශිකා
158.	ඩී.එම්.එන්.එස්.එම්. දිසානායක	ප්‍රදර්ශිකා
159.	කේ.කේ.ජී.සුරන්ජී මාලනි	ප්‍රදර්ශිකා
160.	ආර්.ඒ.සී.ඩී.පෙරේරා	ප්‍රදර්ශිකා
161.	කේ.එන්. ලතාකුමාරි අමරසේකර මිය	ප්‍රදර්ශිකා
162.	ඩී.එම්.සන්ධ්‍යා කුමාරි මිය	ප්‍රදර්ශිකා

	නම	තනතුර
163.	ඩබ්.ඒම්. අනුෂා කුමාරි මිය	ප්‍රදර්ශිකා
164.	බී.පී. වීරසිංහ මහතා	පට්ටල්කරු
165.	ජේ.ඒ.සුගත් මහතා	ප්‍රදර්ශන සහායක
166.	එස්.පී.පී. ඩබ්.එන්.එම්.ප්‍රියදර්ශනී මිය	ප්‍රදර්ශන සහායක
167.	ඩබ්.ජී.රෝහණ මහතා	ප්‍රදර්ශන සහායක
168.	ඩී.එල්.ආර්.ඩබ්. ගුණරත්න මිය	ප්‍රදර්ශන සහායක
169.	ආර්.පී.ජයසිංහ මහත්මිය	ප්‍රදර්ශන සහායක
170.	එස්.පී.චන්ද්‍රාවති මිය	ප්‍රදර්ශන සහායක
171.	කේ.අයි.එස්.ප්‍රනාන්දු මිය	ප්‍රදර්ශන සහායක
172.	එල්.බී.ඒ.එස්.එන්.බාලසූරිය මයා	ප්‍රදර්ශන සහායක
173.	එම්.එච්.වයි. ඩී.ජයසිංහ මිය	ප්‍රදර්ශන සහායක
174.	ජේ.රාජිනී මිය	ප්‍රදර්ශන සහායක
175.	කේ.පී.පුෂ්පා සරෝජිනී මිය	ප්‍රදර්ශන සහායක
176.	එස්.ඩී.චාන්දනී සිල්වා මිය	ප්‍රදර්ශන සහායක
177.	එන්.එම්.කේ.ශිරානි මිය	ප්‍රදර්ශන සහායක
178.	යූ.කේ.පුබුදු රුක්මණී මිය	ප්‍රදර්ශන සහායක
179.	ඩබ්.ඩී.දීපිකා නිල්මිණී රණසිංහ මිය	ප්‍රදර්ශන සහායක
180.	එම්.වී.අජන්තා මුතුගල මිය	ප්‍රදර්ශන සහායක
181.	ඩබ්.කේ.වසන්තා මිය	ප්‍රදර්ශන සහායක
182.	ඒ.විමලේෂ්වරී මිය	ප්‍රදර්ශන සහායක
183.	එල්.ඒ.ඒ.කුමාරි ලියනගේ මිය	ප්‍රදර්ශන සහායක
184.	සුගන්ධි දම්සිකා අලුත්ගේ මහත්මිය	අලෙවි සහායිකා
185.	ඊ.කේ.දයාතිලක මහතා	රියදුරු
186.	එච්.එම්.සුමනසේකර මහතා	රියදුරු
187.	එස්.එම්.ඩබ්.එස්.සමරකෝන් මහතා	රියදුරු
188.	කේ.ඩී.ජී.ඩී.කළුබෝවිල මහතා	රියදුරු
189.	එච්.ඒ. පුෂ්පකුමාර මහතා	රියදුරු
190.	පී.ඒ. මනෝජ් ශිවංක සිල්වා මහතා	රියදුරු
191.	නුවන් වීරසේකර මයා	රියදුරු
192.	ඒ.එන්.උදයසිරි මහතා	කාර්යාල සහායක
193.	ඩබ්.එම්.එස්. චන්ද්‍රරත්න මහතා	කාර්යාල සහායක
194.	ජී.වී. නිමල්සිරි මහතා	කාර්යාල සහායක
195.	ඩී.එල්. නලින්ද ධම්මික මයා	කාර්යාල සහායක
196.	ජේ.චන්ද්‍රරත්න මහතා	කාර්යාල සහායක
197.	බී.ඩී.එස්.රූපසිංහ මිය	කාර්යාල සහායක
198.	දමිත් හර්ෂණ විමලසේන මයා	කාර්යාල සහායක
199.	එම්.යූ.සුමිත් හරිස්චන්ද්‍ර මයා	කාර්යාල සහායක
200.	එම්.පී.එම්.වී.ඉන්ද්‍රානි මැණිකේ මිය	කාර්යාල සහායක
201.	ඩී.පී.එන්.විජේනායක මහතා	කම්කරු
202.	ටී.ලලිත් පතිරාජ මහතා	කම්කරු
203.	ඩී.ආර්.වී.දිසානායක මහතා	කම්කරු
204.	ඒ.එම්.සෙනෙවිරත්න බණ්ඩා මහතා	කම්කරු
205.	ඩබ්.ජී.එච්.ජයසේන මහතා	මුරකරු
206.	ඩි.එම්.එන්.වික්‍රමසිංහ මහතා	මුරකරු
207.	ඩී.එම්.ඩබ්.එස්.කරුණාරත්න මහතා	මුරකරු

ජාතික ශිල්ප සභාවේ කාර්යාල ලිපිනයන්

ප්‍රධාන කාර්යාලය / හස්ත කර්මාන්ත කලාගාර	- රෝහිනා මාවත, පැලවත්ත, බත්තරමුල්ල
මධ්‍යම පළාත	- මධ්‍යම පළාත් කාර්යාලය, උයන්වත්ත, පොල්ගොල්ල
	දිස්ත්‍රික් කාර්යාලය, ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය, අංක 132, මල්වත්ත පාර, මාතලේ
	නුවරඑළිය දිස්ත්‍රික් කාර්යාලය, ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය, නුවරඑළිය
දකුණු පළාත	- දකුණු පළාත් කාර්යාලය, “සිජ්නාරා”, බාලදක්ෂ මාවත, කොටුව - ගාල්ල
	සහකාර කර්මාන්ත ලේකම් කාර්යාලය, වැල්ලමඩම, මාතර
	කර්මාන්ත සහකාර ලේකම් කාර්යාලය, 2 වන මහල, මාගම් රුහුණුපුර පරිපාලන සංකීර්ණය, හම්බන්තොට
බස්නාහිර පළාත	- වරාගොඩ සෙරමික් පුහුණු මධ්‍යස්ථානය, ගල්බොරැල්ල,කැලණිය
	ජාතික ශිල්ප සභා දිස්ත්‍රික් කාර්යාලය, වේවැල් පුහුණු මධ්‍යස්ථානය, බුලත්සිංහල
වයඹ පළාත	- වයඹ පළාත් කාර්යාලය හා කුරුණෑගල දිස්ත්‍රික් කාර්යාලය, ආර්ථික මධ්‍යස්ථානය, වේරපොළ, වාරියපොළ
	කාර්මික සංවර්ධන මණ්ඩලය, කුරුණෑගල පාර, හලාවත
උතුරු පළාත	- උතුරු පළාත් කාර්යාලය, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, යාපනය
	කර්මාන්ත දෙපාර්තමේන්තුව, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, කිලිනොච්චිය
	කර්මාන්ත දෙපාර්තමේන්තුව,කච්චේරිය,මන්නාරම
	ජාතික ශිල්ප සභා කාර්යාලය, පරිපාලන අංශය, කච්චේරිය, වව්නියාව
	දිස්ත්‍රික් කාර්යාලය, කර්මාන්ත දෙපාර්තමේන්තුව, කච්චේරිය, මුලතිව්

ඌව පළාත	- ඌව පළාත් කාර්යාලය, නන්නපුරාව මෙව්වැල් පුහුණු මධ්‍යස්ථානය,5කණුව, නන්නපුරාව, බිබිල
	බදුල්ල දිස්ත්‍රික් කාර්යාලය, අංක 24, රේස්කෝස් පාර, බදුල්ල
නැගෙනහිර පළාත	- කර්මාන්ත දෙපාර්තමේන්තුව (නැගෙනහිර පළාත), උප්පුවේලි, ත්‍රිකුණාමලය
	කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුව, දිස්ත්‍රික් කාර්යාලය, 1වන පටුමග, අම්පාර
	කර්මාන්ත දෙපාර්තමේන්තුව, සරවනා පාර, කල්අඩි, මඩකලපුව
උතුරු මැද පළාත	- කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුව, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, අනුරාධපුරය
	දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, නව නගරය, පොළොන්නරුව
සබරගමුව පළාත	- ජාතික ශිල්ප සභා සබරගමුව පළාත් කාර්යාලය, මොලගොඩ, කෑගල්ල
	කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුව, සබරගමු පලාත් සභාව, පළාත් සභා සංකීර්ණය, නවනගරය, රත්නපුර
හස්ත කර්මාන්ත ගම්මාන	- සීගිරිය හස්ත කර්මාන්ත ගම්මානය, කිඹිස්ස, සීගිරිය
	හම්බන්තොට හස්ත කර්මාන්ත ගම්මානය, කාවන්තිස්සපුර, හම්බන්තොට

1982 අංක 35 දරණ ජාතික ශිල්ප සභා සහ අනුබද්ධ ආයතන පනත අනුව (17 වැනි පරිච්ඡේදය) ජාතික ශිල්ප සභාව වෙත පවරා ඇති බලතල සහ කාර්යයන්

- ශ්‍රී ලංකාවේ සහ විදේශවල ප්‍රදර්ශන පැවැත්වීම.

- හස්ත කර්මාන්ත භාණ්ඩ නිෂ්පාදනය කිරීම සඳහා ප්‍රයෝජනයට ගන්නා වූ අමුද්‍රව්‍යවල සහ නිමි භාණ්ඩවල තත්ත්වය වැඩි දියුණු කිරීම.

- හස්ත කර්මාන්තය අධ්‍යයනය කිරීම සඳහා ත්‍යාග, පදක්කම් සහ ශිෂ්‍යත්ව ඇති කර ප්‍රදානය කිරීම.

- හස්ත කර්මාන්ත භාණ්ඩ මෝස්තර කිරීමේ, නිෂ්පාදනය කිරීමේ හෝ විකිණීමේ යෙදී සිටින්නා වූ ශිල්ප සභා හෝ වෙනත් ආයතන හෝ සංවිධානවලට අමාත්‍යවරයාගේ අනුමැතිය ඇතිව මූල්‍ය සහ වෙනත් යම් ආධාර සැපයීම.

- ශිල්පීන් පුහුණු කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම සහ ශිල්පීන් සහ ආධුනිකයන් සඳහා සියලු වැඩසටහන් පිළිබඳව සහ ශිල්පීන් සමඟ සම්බන්ධතා ඇති පුහුණුවීමේ ආයතන භාර සේවා නියුක්තයන්ට උපදෙස් දීම.

- ශිල්පීන්ගේ සුභසාධනය සඳහා යෝජනා ක්‍රම ආරම්භ කිරීම.

- ශිල්පීන් සඳහා ජාත්‍යන්තර හුවමාරුකර ගැනීමේ වැඩසටහන් ආරම්භ කිරීම.

- ශිල්පීන්ගේ තත්ත්වයන් සහ දක්ෂතා දියුණු කිරීම පිණිස පාරම්පරික, ජාතික සහ ජාත්‍යන්තර මට්ටමේ වැඩමුළු, සම්මන්ත්‍රණ සහ සම්මේලන සංවිධානය කිරීම.

- ශිල්ප වලට අදාල තොරතුරු සහ දැනුම පැතිරවීම සඳහා විධිවිධාන සැලැස්වීම.

- පාරම්පරික, ජාතික හෝ සංස්කෘතික වටිනාකමකින් යුත් හස්ත කර්මාන්ත ආරක්ෂා කිරීම පිළිබඳ උපදෙස් දීම සහ ඒ හස්ත කර්මාන්ත ආරක්ෂා කිරීමේ කාර්යය සඳහා ශිල්ප කෞතුකාගාර සහ චිත්‍රාගාර පිහිටුවීම.

ජාතික ශිල්ප සභාවේ වැඩසටහන් හා ක්‍රියාමාර්ග

- ප්‍රාදේශීය මට්ටමින් ශිල්පීන්ගේ සමිති පිහිටුවීම තුලින් ශිල්පීන් සංවිධානය කිරීම හා ශිල්ප ගම්මාන ඇති කිරීම
- අත්කම් ශිල්පීන් හඳුනාගෙන ජාතික මට්ටමින් ලියාපදිංචි කිරීම හා හැඳුනුම්පත් නිකුත් කිරීම
- ශිල්පීන් සඳහා විරල අමුද්‍රව්‍ය සැපයීම හා එම කටයුතු සංවිධානය කිරීම
- අත්කම් භාණ්ඩවල ගුණාත්මකභාවය වර්ධනය කිරීම හා ප්‍රමිතීන් පවත්වාගෙන යාම සඳහා වැඩමුළු පැවැත්වීම
- ගුරු ශිල්ප පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
- ශිල්පීය පුහුණු මධ්‍යස්ථාන මඟින් පූර්ණ කාලීන හස්ත කර්මාන්ත පුහුණු පාඨමාලා ක්‍රියාත්මක කිරීම හා නිෂ්පාදන පහසුකම් ලබා දීම
- විදේශීය වෙළඳ පොළ සඳහා අත්කම් භාණ්ඩ නිෂ්පාදනය, දිරිගැන්වීම, ප්‍රදර්ශනය කිරීම හා විදේශ ප්‍රදර්ශනවලට ශිල්පීන් ඉදිරිපත් කිරීම
- පළාත් හා ජාතික මට්ටමින් ප්‍රදර්ශන සහ තරඟ පැවැත්වීම තුළින් ශිල්පීන් ඇගයීමට ලක් කිරීම සහ අලෙවි සල්පිල් පැවැත්වීම, ශිල්ප ගම්මාන පිහිටුවීම මඟින් ශිල්පීන්ගේ නිෂ්පාදන භාණ්ඩ අලෙවි කරගැනීම සඳහා පහසුකම් සංවිධානය කිරීම
- ශිල්පීන් සඳහා සුභ සාධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
- ශිල්පීන්ගේ සහ ඔවුන්ගේ පවුල් වල ආර්ථික හා සමාජයීය තත්ත්වය නංවාලීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
- ඉහත සඳහන් වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ දී පලාත් සභා සහ ප්‍රාදේශීය මට්ටමින් රාජ්‍ය ආයතන සමඟ කටයුතු සම්බන්ධීකරණ කිරීම

ජාතික ශිල්ප සභාව මගින් අනුග්‍රහය ලබන හස්ත කර්මාන්ත ක්ෂේත්‍ර

ශාක ආශ්‍රිත නිර්මාණ

1. පත්‍ර ආශ්‍රිත නිර්මාණ
- 1.1 තල් කොළ ආශ්‍රිත නිර්මාණ
- 1.2 තල කොළ ආශ්‍රිත නිර්මාණ
- 1.3 වෙනත් පත්‍ර ආශ්‍රිත නිර්මාණ

2. හණ ආශ්‍රිත නිර්මාණ
- 2.1 හණ ආශ්‍රිත දුම්බර රටා නිර්මාණ
- 2.2 හණ ආශ්‍රිත වෙනත් නිර්මාණ

3. පන් ආශ්‍රිත නිර්මාණ
- 3.1 පන් ආශ්‍රිත පැදුරු නිර්මාණ
- 3.2 පන් ආශ්‍රිත වෙනත් නිර්මාණ

4. වෙනත් තෘණ ආශ්‍රිත නිර්මාණ

5. වෙනත් කෙඳි ආශ්‍රිත නිර්මාණ

6. වේවැල් ආශ්‍රිත නිර්මාණ

7. උණබට ආශ්‍රිත නිර්මාණ

8. කපු ආශ්‍රිත නිර්මාණ
- 8.1 කපු ආශ්‍රිත දුම්බර රටා නිර්මාණ
- 8.2 කපු ආශ්‍රිත වෙනත් නිර්මාණ

9. දැව ආශ්‍රිත නිර්මාණ
- 9.1 දැව ආශ්‍රිත කැටයම් නිර්මාණ
- 9.2 දැව ආශ්‍රිත මූර්ති නිර්මාණ
- 9.3 දැව ආශ්‍රිත සාම්ප්‍රදායික වෙස් මුහුණු නිර්මාණ
- 9.4 දැව ආශ්‍රිත සාම්ප්‍රදායික නොවන වෙස් මුහුණු ර්මාණ
- 9.5 දැව ආශ්‍රිත කැටයම් වෙස්මුහුණු නිර්මාණ
- 9.6 දැව ආශ්‍රිත වෙනත් නිර්මාණ

10. ශාක ආශ්‍රිත වෙනත් නිර්මාණ
- 10.1 පොල්කටු ආශ්‍රිත නිර්මාණ
- 10.2 පොල්ගෙඩි ආශ්‍රිත නිර්මාණ
- 10.3 ඉරටු හා මඩුලු ආශ්‍රිත නිර්මාණ
- 10.4 කිරිමදුවැල් ආශ්‍රිත නිර්මාණ
- 10.5 වෙනත් නිර්මාණ

ලෝහ ආශ්‍රිත නිර්මාණ

11. පිත්තල ආශ්‍රිත නිර්මාණ
- 11.1 පිත්තල ආශ්‍රිත කැටයම් නිර්මාණ
- 11.2 පිත්තල ආශ්‍රිත භාත්තු නිර්මාණ

12. රිදී ආශ්‍රිත නිර්මාණ
- 12.1 රිදී ආශ්‍රිත කැටයම් නිර්මාණ
- 12.2 රිදී ආශ්‍රිත ආභරණ නිර්මාණ

13. රන් ආශ්‍රිත නිර්මාණ
- 13.1 රන් ආශ්‍රිත කැටයම් නිර්මාණ
- 13.2 රන් ආශ්‍රිත ආභරණ නිර්මාණ

14. ලෝහ ආශ්‍රිත වෙනත් නිර්මාණ

මැටි/ වැලි / පාෂාණ / ඛනිජ ආශ්‍රිත නිර්මාණ

15. කළු ගල් ආශ්‍රිත නිර්මාණ
- 15.1 කළු ගල් ආශ්‍රිත කැටයම් නිර්මාණ
- 15.2 කළු ගල් ආශ්‍රිත මූර්ති නිර්මාණ
- 15.3 කළු ගල් ආශ්‍රිත වෙනත් නිර්මාණ

16. මැටි ආශ්‍රිත නිර්මාණ

17. සෙරමික් ආශ්‍රිත නිර්මාණ

18. ගල් බැඳි ආභරණ

19. මැටි / වැලි / පාෂාණ / ඛනිජ ආශ්‍රිත වෙනත් නිර්මාණ

සත්ත්ව කොටස් ආශ්‍රිත නිර්මාණ

20. සම් ආශ්‍රිත නිර්මාණ

21. සිප්පිකටු ආශ්‍රිත නිර්මාණ

22. වෙනත් සත්ත්ව කොටස් ආශ්‍රිත නිර්මාණ

රෙදි ආශ්‍රිත නිර්මාණ

23. බතික් ආශ්‍රිත නිර්මාණ
- 23.1 බතික් ආශ්‍රිත ඇඟළුම් නිර්මාණ
- 23.2 බතික් ආශ්‍රිත බිත්ති සැරසිලි
- 23.3 බතික් ආශ්‍රිත වෙනත් නිර්මාණ

24. රේන්ද ආශ්‍රිත නිර්මාණ
- 24.1 බීරළු රේන්ද ආශ්‍රිත නිර්මාණ
- 24.2 තැටින් රේන්ද ආශ්‍රිත නිර්මාණ
- 24.3 අත් රේන්ද ආශ්‍රිත නිර්මාණ

25. පෙහෙකම් (අත්යන්ත්‍ර රෙදි) ආශ්‍රිත නිර්මාණ
- 25.1 පෙහෙකම් (අත්යන්ත්‍ර රෙදි) ආශ්‍රිත ඇඟලුම් නිර්මාණ
- 25.2 පෙහෙකම් (අත්යන්ත්‍ර රෙදි) ආශ්‍රිත වෙනත් නිර්මාණ

26. රෙදි ආශ්‍රිත එම්බ්‍රොයිඩර් නිර්මාණ
- 26.1 රෙදි ආශ්‍රිත අත් එම්බ්‍රොයිඩර් නිර්මාණ
- 26.2 රෙදි ආශ්‍රිත වෙනත් එම්බ්‍රොයිඩර් නිර්මාණ

27 රෙදි ආශ්‍රිත වෙනත් නිර්මාණ

මිශ්‍ර මාධ්‍ය භාවිතයන් ආශ්‍රිත නිර්මාණ

28. සේසත් නිර්මාණ

29. ලාක්ෂා නිර්මාණ

30. රූකඩ නිර්මාණ

31. දේශීය වාද්‍ය භාණ්ඩ

32. සාම්ප්‍රදායික චිත්‍ර නිර්මාණ

33. සාම්ප්‍රදායික බලි මූර්ති නිර්මාණ

34. පාරම්පරික උත්සව ආශ්‍රිත කලා නිර්මාණ

35. ප්‍රතිචක්‍රීයකරණ මාධ්‍ය භාවිත නිර්මාණ

36. මිශ්‍ර මාධ්‍ය භාවිත වෙනත් නිර්මාණ

3) ජාතික ශිල්ප සභාවේ සංවර්ධන කාර්යයභාරය

1. අමුද්‍රව්‍ය කළමණාකරණ වැඩසටහන

හස්ත කර්මාන්ත නිෂ්පාදන ආශ්‍රිතව භාවිතා කරනු ලබන දුර්ලභ අමුද්‍රව්‍ය සුලභ කිරීම සඳහා රජයේ භාවිතා නොකල ඉඩම් යොදාගනිමින් අමුද්‍රව්‍ය සුලභ කිරීම සඳහා රජයේ භාවිතා නොකල ඉඩම් යොදා ගනිමින් අමුද්‍රව්‍ය වගා ව්‍යාපෘතිය (කදුරු, වේවැල්, උණ, ගිනිසපු, හණ, පන්, වැටකේ හා වෙනත්) ක්‍රියාත්මක කිරීම, පිත්තල, රිදී අමුද්‍රව්‍ය නිකුත් කිරීම හා කළුවර දැව සඳහා නිර්දේශ ලබා දීමත්, මැටි ප්‍රවාහන හා බෙදාහැරීමේ පහසුකම් සැලසීමත් මේ යටතේ සිදු කෙරේ.

ඒ අනුව, 2020 වසරේ වගා කර ඇති පැල සංඛ්‍යාව 9588 ක් වන අතර රිදී සහ පිත්තල අමුද්‍රව්‍ය නිකුත් කිරීම සහ දැව බලපත්‍ර සඳහා නිර්දේශ ලබා දුන් ප්‍රතිලාභීන් සංඛ්‍යාව 180 කි.

අමුද්‍රව්‍ය කළමණාකරණ වැඩසටහන ක්‍රියාත්මක කිරීම

	ස්ථානය / දිස්ත්‍රික්කය	පැල වර්ගය	පැල සංඛ්‍යාව
01	දෙහිවල - ගල්කිස්ස වෙරළ තීරය	වැටකේ	75
02	වාද්දුව පොතුපිටිය පුහුණු මධ්‍යස්ථානය අවට මුහුදු තීරය	වැටකේ	80
03	තලේ පහලහපුවිද ලාක්ෂා පුහුණු මධ්‍යස්ථානය	ගිණිසපු	250
04	මාවනැල්ල - බදුලුපිටිය හණ පුහුණු මධ්‍යස්ථානය	හණ	100
05	යටියන්තොට - පැලැල්ලේගම	උණබට	40
06	කුරුවිට, රත්නපුරය	උණබට	20
07	විකිලිය හණ පුහුණු මධ්‍යස්ථානය	හණ	10
08	කුරුණෑගල - මැල්සිරිපුර දියතුරේ ගම්මානය	උණබට	50
09	කුරුණෑගල - පඩුවස්නුවර මාවීඇළ ප්‍රා.ලේ.කාර්යාලය	ගල්ලැහැපන්	1500
10	පුත්තලම - කල්පිටිය වෙරළ	වැටකේ,කඩොලාන,තල්	50,30,20
11	හම්බන්තොට - කාවන්තිස්සපුර ගම්මානය	හල්මිල්ල,නැදුන්	25,25
12	ගාල්ල - දලවැල්ල හබරාදුව ගම්මානය	වැටකේ	40
13	මාතර - අඟුල්මඩුව ගම්මානය	කුඹුක්	25
14	බදුල්ල - නන්නපුරාව පුහුණු මධ්‍යස්ථානය	අඹ,හණ,වේවැල්	03,100,100
15	පොළොන්නරුව - ලංකා පුර ප්‍රා. ලේ. කාර්යාලය	පන්	3000
16	ත්‍රිකුණාමලය - පතිනිපුරම් ගම්මානය	තල්,තේක්ක,පොල්	400,15,30
17	යාපනය - වාවකච්චේරිය විදුලිබල මණ්ඩලය ඉදිරිපිට	මහෝගනී, තේක්ක, කොහොඹ	50
18	මන්නාරම - නර්විලිකුලම් ගම්මානය	තල්	25
19	කිලිනොච්චිය - තාරපුරම් පේෂකර්ම මධ්‍යස්ථානය	මහෝගනී, තේක්ක, කොහොඹ	25
20	හම්බන්තොට	හණ	1000
21	හම්බන්තොට	කළුවර	500
22	ආලෝකගම	ගිනිසපු	1000
23	නුවරඑළිය	මහෝගනී	1000
එකතුව			**9588**

අමුද්‍රව්‍ය වගා කිරීමේ වැඩසටහනේ විශේෂ අවස්ථා










2. හස්ත කර්මාන්ත ශිල්පීන් ලියාපදිංචි කිරීම, හැඳුනුම්පත් නිකුත් කිරීම සහ වෙබ් අඩවිය යාවත්කාලීන කිරීම

ශ්‍රී ලංකාව පුරා විසිරී සිටින හස්ත කර්මාන්ත ක්ෂේත්‍රයෙහි නියැලි ශිල්පීන් ලියාපදිංචි කිරීම ජාතික ශිල්ප සභාව මඟින් සිදු කරනු ලබයි. එමඟින් අපේක්ෂා කරනුයේ සැබෑ ලෙසම හස්ත කර්මාන්ත කලාවේ නියැලෙන්නන් තෝරාගෙන, ඔවුන්ගේ අනන්‍යතාවය තහවුරු කරමින්, ශිල්පීන් සමඟ අඛණ්ඩ සම්බන්ධතාවයක් පවත්වාගෙන යාමයි. ඒ තුළින් හස්ත කර්මාන්ත ශිල්පීන්ගේ සමාජ ආර්ථික දියුණුවට රාජ්‍ය මට්ටමින් මැදිහත් වීම සහ ශිල්පීන්ට ඔවුන්ගේ නිෂ්පාදන කටයුතු කර ගැනීමට අවශ්‍ය උපදෙස් හා පහසුකම් සැපයීමත් අපේක්ෂා කරනු ලබයි.

2020.12.31 දිනට ලියාපදිංචි ශිල්පීන් සංඛ්‍යාව

	පළාත	දිස්ත්‍රික්කය	ලියාපදිංචි ශිල්පීන් සංඛ්‍යාව	මුළු ලියාපදිංචි ශිල්පීන් සංඛ්‍යාව
01	බස්නාහිර	කොළඹ ගම්පහ කළුතර	142 131 210	483
02	මධ්‍යම	මහනුවර මාතලේ	167 67	234
03	වයඹ	කුරුණෑගල පුත්තලම	326 102	428
04	උතුරු මැද	අනුරාධපුරය පොළොන්නරුව	80 109	189
05	ඌව	බදුල්ල මොණරාගල	56 84	140
06	සබරගමුව	කෑගල්ල රත්නපුරය	134 126	260
07	දකුණ	ගාල්ල මාතර හම්බන්තොට	437 369 257	1063
08	උතුර	වව්නියාව	50	50
09	නැගෙනහිර	මඩකලපුව	47	47
එකතුව				**2894**

3. දත්ත පද්ධතිය ස්ථාපිත කිරීම

ශ්‍රී ලංකාව පුරා විසිරී සිටින හස්ත කර්මාන්ත ක්ෂේත්‍රයෙහි නියැලි ශිල්පීන් ලියාපදිංචි කිරීම හා නව හැඳුනුම්පත් නිකුත් කිරීම මෙමඟින් සිදු කරනු ලැබේ. එයින් අපේක්ෂා කරනුයේ සැබෑ ලෙසම හස්ත කර්මාන්ත කලාවේ නියැලෙන්නන් තෝරාගෙන, ඔවුන්ගේ අනන්‍යතාවය තහවුරු කරමින්, ශිල්පීන් සමඟ අඛණ්ඩ සම්බන්ධතාවයක් පවත්වාගෙන යාම වේ. තවද, හස්ත කර්මාන්ත ශිල්පීන්ගේ කාලීන තොරතුරු විස්තරාත්මකව ලබාගෙන දත්ත පද්ධතිය යාවත්කාලීන කර එක් එක් ශිල්පීන්ගේ නිෂ්පාදන ධාරිතාවය, කුසලතාවයන්, ක්ෂේත්‍රයේ භාවිත අමුද්‍රව්‍ය හා අනෙකුත් අවශ්‍යතා ග්‍රාම නිලධාරී වසම්, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ හා දිස්ත්‍රික් මට්ටමින් හඳුනා ගැනීම මෙන්ම අවශ්‍ය ඕනෑම අවස්ථාවක ලැබෙන දේශීය හා විදේශීය ඇනවුම් සඳහා මෙම තොරතුරු පද්ධතිය හරහා ශිල්පීන් වෙත අවස්ථාව ලබා දීමට හැකිවනු ඇත.

4. ශිල්ප සුභ සාධන වැඩසටහන

ජාතික ශිල්ප සභාව මගින් ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන් අතර ශිල්ප සුභසාධන වැඩසටහන ප්‍රධානම කාර්යයක් වන අතර එමගින් ශිල්පීන් සඳහා මහඟු සේවාවක් ඉටු කරනු ලැබේ. මෙම වැඩසටහන යටතේ වයස්ගත ශිල්පීන්, ආබාධිත මට්ටමේ ශිල්පීන් සඳහා ආධාර මුදලක් ලබා දීම මෙන්ම ඒ ඒ අවස්ථාවලදී ශිල්පීන් විසින් කරනු ලබන ඉල්ලීම් සඳහා (සැත්කම්, හෘදයාබාධ, අක්ෂි රෝග හා විශේෂ සැත්කම් ආදී) ශිල්ප සුභ සාධන ව්‍යවස්ථාවට අනුකූලව ප්‍රතිචාර දැක්වීම සිදු කරනු ලබයි. මෙම වැඩසටහන යටතේ මෙම වසරේ දී ශිල්පීන් 41 දෙනෙකු සඳහා පහසුකම් සලසා දී ඇත.

5. ස්වයං රැකියා ආරම්භ කිරීම සඳහා යන්ත්‍ර සූත්‍ර, උපකරණ, මෙවලම් සහ අමුද්‍රව්‍ය ලබා දීම

ජාතික ශිල්ප සභාව මගින් ක්‍රියාත්මක කරනු ලබන සියලුම පුහුණු වැඩසටහන්වල පුහුණුලාභීන් හා සහජ හැකියාවන් ඇති ශිල්පීන්ට හස්ත කර්මාන්ත ආශ්‍රිත ස්වයං රැකියා ආරම්භ කිරීම සඳහා අවශ්‍ය පහසුකම් සැපයීම තුලින් රැකියා ජනිත කිරීමේ ඉලක්කය සපුරාලීම සඳහා සහය වීම මෙන්ම හස්ත කර්මාන්ත ක්ෂේත්‍රයෙන් ජාතික ආර්ථිකයට හැකි උපරිමයෙන් දායක කර ගැනීම සඳහා දිරිගැන්වීම මෙම වැඩසටහනින් අපේක්ෂිතය. මෙම වැඩසටහන යටතේ මේ වසරේ දී ප්‍රතිලාභීන් 570 දෙනෙකු සඳහා පහසුකම් සලසා දී ඇත.

ස්වයං රැකියා ආරම්භ කිරීම සඳහා පහසුකම් ලබා දීමේ අවස්ථා









6. "ගම්බිම් - වැඩබිම්" බවට පත්කිරීමේ හස්ත කර්මාන්ත ගම්මාන සංවර්ධන වැඩසටහන

ශ්‍රී ලංකාව පුරා විසිරී පවතින සියලුම හස්ත කර්මාන්ත ගම්මාන හඳුනාගෙන එම ගම්මානයන් හි යටිතල පහසුකම් (මාර්ග, ජලය, විදුලිය, පොදු පහසුකම් මධ්‍යස්ථාන), යන්ත්‍රෝපකරණ, අමුද්‍රව්‍ය, උපකරණ, නිෂ්පාදන ප්‍රවර්ධන වැඩසටහන්, වෙළඳපොල අවශ්‍යතා හා ප්‍රචාරණය යන සියලුම අංශ යටතේ සංවර්ධනය කිරීම මේ යටතේ සිදු වේ. ඒ අනුව, කොවුල්ආර, මොලගොඩ, බල්ලපාන, රදාවඩුන්න යන ගම්මානයන් සංවර්ධනය කරනු ලැබූ අතර පසුගිය වසරේ සංවර්ධනය කරන ලද ගම්මාන ජනතා අයිතියට පැවරීම ද සිදු කරන ලදී.



බල්ලපාන - කෑගල්ල



මොලගොඩ - කෑගල්ල





කොවුල්ආර - මොනරාගල

ත්‍රිකුණාමලය - පතිනිපුරම් තල්කොළ ආශ්‍රිත භාණ්ඩ නිෂ්පාදන ගම්මානය ජනතා අයිතියට පැවරීම





මාතර පොළතුගොඩ රන්, රිදී ආශ්‍රිත භාණ්ඩ නිෂ්පාදන ගම්මානය ජනතා අයිතියට පැවරීම





මාතර - කොටවිල මැටි ආශ්‍රිත භාණ්ඩ නිෂ්පාදන ගම්මානය ජනතා අයිතියට පැවරීම





7. නව තාක්ෂණය හඳුන්වා දීම

මේ යටතේ හස්ත කර්මාන්ත ආශ්‍රිත අමුද්‍රව්‍ය සැකසීම, නිෂ්පාදන ක්‍රියාවලියට අදාල නව තාක්ෂණික ක්‍රමවේදයන් හා නිෂ්පාදන ධාරිතාවය මෙන්ම ගුණත්වය / ප්‍රමිතිය ඉහල නංවන නව යන්ත්‍රෝපකරණ හඳුන්වා දී ඇත. මේ යටතේ කර්මාන්තකරුවන් 20 දෙනෙකු සඳහා නව තාක්ෂණික උපකරන පහසුකම් ලබා දී ඇත.

තෙරපුම් යන්ත්‍ර





8. හස්ත කර්මාන්ත පුහුණු ව්‍යාපෘතිය සහ විශේෂ පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය යටතේ ක්‍රියාත්මක වූ ශිල්පිය පුහුණු අංශය අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංක 08/2322/349/015 යටතේ වූ 2008.12.23 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි 2009.05.01 දින සිට ජාතික ශිල්ප සභාව වෙත පවරා ඇත. ඒ අනුව, ජාතික ශිල්ප සභාව වෙත සේවකයින් 185 දෙනෙකු 2009.05.01 දින සිට අනුයුක්ත කර තිබේ. රාජ්‍ය ව්‍යාපාර අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක පිඊ/214/9-Vol 1 හා 2008.01.11 දිනැති ලිපියෙන් දී ඇති එකඟත්වය සහ ජාතික ශිල්ප සභා අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය මත ශිල්පිය පුහුණු අංශය ජාතික ශිල්ප සභාව යටතේ හස්ත කර්මාන්ත පුහුණු ව්‍යාපෘතිය නමින් 2009.05.01 දින සිට ක්‍රියාත්මක වේ.

හස්ත කර්මාන්ත පුහුණු ව්‍යාපෘතිය යටතේ ක්‍රියාත්මක පුහුණු මධ්‍යස්ථාන මගින් 2020 වසරේදී ආධුනිකයින් 517 දෙනෙකු සඳහා පුහුණුව ලබා දී ඇති අතර මධ්‍යස්ථාන මගින් නිෂ්පාදන පහසුකම් සලසා ගත් කර්මාන්තකරුවන් සංඛ්‍යාව 461කි.

හස්ත කර්මාන්ත පුහුණු මධ්‍යස්ථාන මගින් පුහුණුව හා නිෂ්පාදන පහසුකම් ලැබූ පුහුණුලාභීන් හා නිෂ්පාදිකාවන් සංඛ්‍යාව

	දිස්ත්‍රික්කය	පුහුණුලාභීන් සංඛ්‍යාව	නිෂ්පාදිකාවන් සංඛ්‍යාව
01	මහනුවර	67	62
02	මාතලේ	10	09
03	නුවරඑළිය	23	45
04	ගම්පහ	09	31
05	කළුතර	23	29
06	ගාල්ල	15	27
07	මාතර	38	16
08	හම්බන්තොට	37	14
09	රත්නපුරය	35	25
10	කෑගල්ල	34	22
11	අනුරාධපුරය	19	04
12	පොළොන්නරුව	38	18
13	මොණරාගල	04	-
14	ත්‍රිකුණාමලය	20	-
15	මඩකලපුව	46	18
16	කුරුණෑගල	88	138
17	යාපනය	11	03
එකතුව		517	461

9. පුහුණු මධ්‍යස්ථාන වැඩිදියුණු කිරීම සහ අලුත්වැඩියා කිරීම

ජාතික ශිල්ප සභාව යටතේ ක්‍රියාත්මක ශිල්පීය පුහුණු මධ්‍යස්ථාන 112 ක් පමණ තිබෙන අතර මෙම මධ්‍යස්ථාන බොහොමයක් භාවිතයට ගත නොහැකි යල්පැනගිය ගොඩනැගිලි හා අනෙකුත් අනෙකුත් වලින් සමන්විත වේ. එනිසාවෙන්, අවම පහසුකම් වලින්වත් සමන්විත වන පරිදි මෙම මධ්‍යස්ථාන සංවර්ධනය කර නව පරම්පරාව හස්ත කර්මාන්ත ක්ෂේත්‍රය කෙරෙහි දක්වන උනන්දුව වැඩි කිරීම මෙමගින් අපේක්ෂා කෙරේ. ඒ අනුව, මෙම වසරේ පුහුණු මධ්‍යස්ථාන 08 ක (බත්තරමුල්ල, මනම්පිටිය, හබරාදුව, පොල්ගොල්ල, වරාගොඩ, වීරගුල, වලව්වත්ත සහ පහලහපුවිද යන පුහුණු මධ්‍යස්ථානයන්) සංවර්ධන කටයුතු සිදු කර ඇත.

	දිස්ත්‍රික්කය	පුහුණු මධ්‍යස්ථානයේ නම
01	කොළඹ	බත්තරමුල්ල පුහුණු මධ්‍යස්ථානය
02	පොළොන්නරුව	මනම්පිටිය පුහුණු මධ්‍යස්ථානය
03	ගාල්ල	හබරාදුව පුහුණු මධ්‍යස්ථානය
04	මහනුවර	පොල්ගොල්ල පුහුණු මධ්‍යස්ථානය
05	ගම්පහ	වරාගොඩ සෙරමික් පුහුණු මධ්‍යස්ථානය
06	ගම්පහ	වීරගුල පුහුණු මධ්‍යස්ථානය
07	ගම්පහ	වලව්වත්ත පුහුණු මධ්‍යස්ථානය
08	මාතලේ	පහලහපුවිද ලාක්ෂා පුහුණු මධ්‍යස්ථානය

ගම්පහ - වරාගොඩ පුහුණු මධ්‍යස්ථානය





බත්තරමුල්ල පුහුණු මධ්‍යස්ථානය





මහනුවර - පොල්ගොල්ල පුහුණු මධ්‍යස්ථානය





වලව්වත්ත පුහුණු මධ්‍යස්ථානය





මනම්පිටිය



හබරාදූව



10. හස්ත කර්මාන්ත නිෂ්පාදන සහ අළෙවි ගම්මාන ස්ථාපිත කිරීම සහ වැඩිදියුණු කිරීම

හස්ත කර්මාන්ත ශිල්පීන්ගේ නිර්මාණ සඳහා අළෙවි පහසුකම් ලබා දීමේ අරමුණින් ජාතික ශිල්ප සභාව මගින් හස්ත කර්මාන්ත නිෂ්පාදන හා අළෙවි ගම්මාන ස්ථාපිත කිරීමේ වැඩසටහන ක්‍රියාත්මක කර එම ගම්මානයන් හි සංවර්ධන කටයුතු ද සිදු කර ඇත.

සීගිරිය හස්ත කර්මාන්ත නිෂ්පාදන හා අළෙවි ගම්මානය





11. දේශීය අළෙවි ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

ශ්‍රී ලංකාවේ හස්ත කර්මාන්ත ක්ෂේත්‍රයේ නියැලී සිටින ශිල්පීන්ගේ නිර්මාණ සඳහා වෙළඳපල අවස්ථා පුළුල් කිරීම හා තම නිර්මාණ සාධාරණ මිලකට අළෙවිකරමින් දේශීය හා විදේශීය පාරිභෝගිකයින් අතර දේශීය අනන්‍යතාවය හා සංස්කෘතිමය වටිනාකමක් සහිත නිර්මාණ ජනප්‍රිය කරවීමේ අරමුණින් වසරේ විවිධ කාල වකවානු වලදී දේශීය අළෙවි ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබයි. ඒ අනුව, මෙම වසරේ දේශීය අළෙවිපොළ සහ ප්‍රදර්ශන 04 ක් සඳහා ශිල්පීන් 529 කට පහසුකම් ලබා දී ඇත.

තවද, MAS Intimates ආයතනය හා අමාත්‍යාංශය අතර ඇති කර ගත් අවබෝධතා ගිවිසුම අනුව රු. මි. 45.0 ක වටිනාකමකින් යුත් මැටි ජල බඳුන් 36,000 ක විශේෂ ඇණවුමක් ලබා දීමට අදාල කටයුතු සිදු කර ඇත.

	ප්‍රදර්ශනයේ නම	ස්ථානය	දිනය	සහභාගී වූ ශිල්පීන් සංඛ්‍යාව
01	සාම්ප්‍රදායික චිත්‍ර ප්‍රදර්ශනය	කොළඹ 07- ලයනල් වෙන්ට්ඩ් කලාගාරය	2020 ජනවාරි 11 සිට 14 දක්වා	07
02	සිතුවමින් දිනමු චිත්‍ර වැඩමුළුව	බත්තරමුල්ල - අපේගම පරිශ්‍රය	2020 පෙබරවාරි 23	140
03	Shilpa Thursday අළෙවිපොළ	බත්තරමුල්ල - දියත උයන	සෑම බ්‍රහස්පතින්දා දිනකම	150
04	තිස්සමහාරාම අළෙවිපොළ	තිස්සමහාරාමය	2020 ඔක්තෝබර් 03 සිට 04 දක්වා	07
වෙනත් (රූපවාහිනී වැඩසටහන්, ඇණවුම්, Face book Crafts Promotion සඳහා සහ වෙනත්)				225
එකතුව				529

MAS Intimates ආයතනය හා අමාත්‍යාංශය අතර අවබෝධතා ගිවිසුම අත්සන් කරන අවස්ථාව





නිෂ්පාදන කටයුතු සිදු කරන ආකාරය නිරීක්ෂණය









සාම්ප්‍රදායික චිත්‍ර ප්‍රදර්ශනය - ලයනල් වෙන්ට්ඩ් කලාගාරය





“සිතුවමින් දිනමු” සාම්ප්‍රදායික චිත්‍ර වැඩමුළුව - “අපේ ගම” පරිශ්‍රය, බත්තරමුල්ල





“ශිල්ප Thursday” සාම්ප්‍රදායික හස්ත කර්මාන්ත වෙළඳ ප්‍රදර්ශනය - දියත උයන, බත්තරමුල්ල









12. විදේශීය අළෙවි ප්‍රවර්ධන සහ පුහුණු වැඩසටහන් සඳහා සහභාගී වීම

විදේශීය රටවල් තුල ශ්‍රී ලාංකීය හස්ත කර්මාන්ත නිර්මාණ ප්‍රචලිත කිරීම අතිශයින්ම වැදගත් වන්නේ ශ්‍රී ලංකාවේ සංස්කෘතිය සහ විශිෂ්ඨ වූ නිර්මාණශීලීත්වය ලොවට පෙන්වීමට ඇති ප්‍රබලම මාධ්‍ය ලෙසයි. මේ සඳහා දැනටමත් ජාතික ශිල්ප සභාව මගින් ඉන්දියාව, ඉන්දුනීසියාව, ජර්මනිය, මැලේසියාව වැනි රටවල් වල පැවැත්වෙන ප්‍රදර්ශන සඳහා ශිල්පීන් සහභාගී කරවනු ලබයි. ඒ අනුව, මෙම වසරේ දී ඉන්දියාවේ හර්යානාහි 2020 පෙබරවාරි 01සිට 16 දක්වා පැවති සුරාජ් කුණ්ඩ ක්‍රාෆ්ට් මේලා සඳහා ශ්‍රී ලංකාව නියෝජනය කරමින් ශිල්පීන් 08 දෙනෙකු සහභාගී විය. එහි අලෙවි වටිනාකම රු.මි.0.702ක් විය. තවද මෙම අළෙවි ප්‍රවර්ධන වැඩසටහනට සහභාගී වීම මගින් විදෙස් රටවල හස්ත කර්මාන්ත සහ ඔවුන්ගේ ශිල්පීය ක්‍රමවේද පිළිබඳව දැනුමක් ලබා ගැනීමට මෙම ශිල්පීන්ට හැකියාව ලැබුණි.

	ශිල්පියාගේ නම	ක්ෂේත්‍රය	දිස්ත්‍රික්කය
01	ඩබ්. සමන් රේණුක විජේසිරි මහතා	ලාක්ෂා	මාතලේ
02	ඒ. ජී. තනූජා දර්ශනී ගුණරත්න මහත්මිය	බීරළු රේන්ද	ගාල්ල
03	ඩබ්. ඒ. චතුරිකා උදයංගනී වීරසිංහ මහත්මිය	බතික්	අනුරාධපුරය
04	එස්. යෝගේෂ්වරී මහත්මිය	පන්	මන්නාරම
05	අයි. ඩබ්. ඒ. රුවන් කුමාර මහතා	රිදී ආභරණ	ගම්පහ
06	එච්. ජී. නිමල් කරුණාතිලක මහතා	හණ	කුරුණෑගල
07	ඊ. ඒ. වසන්ත පුෂ්පකුමාර මහතා	පොල්කටු	කොළඹ
08	ඒ. ඩී. එස්. පී. වජිරකාන්ත මහත්මිය	සාම්ප්‍රදායික චිත්‍ර	කුරුණෑගල

සුරාජ් කුණ්ඩ ක්‍රාෆ්ට් මේලා -2020









13. මානව සම්පත් සංවර්ධන වැඩසටහන

ආයතනයක් සතු වටිනාම සම්පත වන මානව සම්පත සංවර්ධනය කාලීන අවශ්‍යතාවක් මෙන්ම එතුලින් සේවක තෘප්තිය ද ඵලදායීතාව ද ඉහල නැංවීමට හැකි වේ. මෙම වැඩසටහන තුලින් ආයතනයේ කාර්ය මණ්ඩලයේ කුසලතා සහ දැනුම වර්ධනය කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කෙරේ. මෙහි දී මූලිකවම ඉංග්‍රීසි භාෂා, පරිගණක දැනුම, ව්‍යාපෘති කළමණාකරණය යන අංශ කෙරෙහි අවධානය යොමු කෙරේ.

ඒ අනුව 2020 වසරේ මානව සම්පත් කළමනාකරණ වැඩසටහන යටතේ පුහුණු ලබා දුන් සේවක සංඛ්‍යාව 56කි.

	වැඩසටහන	සහභාගීවූ නිළධාරියාගේ නම	තනතුර	දිනය	වියදම (රු.)
01	විශේෂ පුහුණු වැඩසටහන	සහකාර අධ්‍යක්ෂවරු සහ සංවර්ධන සහකාරවරුන් (ප්‍රධාන / පළාත් කාර්යාල)		2020.02.10	53,260/=
02	රජයේ දේපල - හානි, අලාභ, නැතිවීම හා අනතුරු පිළිබඳ	ප්‍රසන්න චන්දිමාල් දේශප්‍රිය මහතා පන්ථක රසික් කුමාරසිංහ මහතා	හස්ත කර්මාන්ත ව්‍යාප්ති සහකාර	2020.09.10	14,000/=
03	පරිගණක පුහුණු වැඩසටහන	පළාත් සහකාර අධ්‍යක්ෂවරු		2020.09.30	









04) මූල්‍ය කාර්යය සාධනය

2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා මූල්‍ය ප්‍රකාශනය

පටුන

			පිටු අංකය
1.	මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය		38
2.	මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය		39
3.	වර්ෂයේ ශුද්ධ වත්කම්/ ස්කන්ධ වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශනය		39
4.	ගණකාධිකරණ ප්‍රතිපත්ති සහ සටහන්		40
5.	මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශනය		41
6.	බැංකු ශේෂ	(සටහන 01)	42
7.	ලැබිය යුතු ගිණුම්	(සටහන 02)	42
8.	තොග	(සටහන 03)	42
9.	පෙර ගෙවුම්	(සටහන 04)	43
10.	කාර්ය මණ්ඩල ණය ශේෂ	(සටහන 05)	44-46
11.	ඇප තැන්පතු	(සටහන 06)	47
12.	වෙනත් අත්තිකාරම්	(සටහන 07)	48
13.	ස්ථාවර තැන්පතු	(සටහන 08)	48
14.	ගෙවිය යුතු වියදම්	(සටහන 09)	48
15.	ස්ථාවර වත්කම් උපලේඛනය	(සටහන 10)	49
16.	උපචිත වියදම්	(සටහන 11)	50
17.	පාරිතෝෂික ප්‍රතිපාදන	(සටහන 12)	51-53
18.	භාණ්ඩාගාර ප්‍රදාන	(සටහන13)	54
19.	වෙළඳ ගිණුම -අමුද්‍රව්‍ය	(සටහන14)	55
20.	වෙනත් ආදායම්	(සටහන15)	55
21.	ශිල්ප අරමුදල	(සටහන16)	56
22.	ශිල්ප සුභසාධන	(සටහන17)	57
23.	අනුග්‍රාහක වැඩසටහන්	(සටහන18)	57
24.	මෙහෙයුම් පිරිවැය	(සටහන19)	58-59
25.	ශිල්ප සංවර්ධන හා සුභසාධන පිරිවැය	(සටහන20)	60-61
26.	ශිල්ප ගම්මාන සංවර්ධනය	(සටහන21)	62
27.	මහජන බැංකුව	(සටහන22)	62
28.	පෙර වර්ෂයට අදාළ ගැලපීම්	(සටහන 23)	63-64
29.	ශිල්ප පුහුණු මධ්‍යස්ථාන -ආදායම හා වියදම - බැංකු විස්තර		65-68
30.	ශේෂ පත්‍රය		69-72

ජාතික ශිල්ප සභාව
2020 දෙසැම්බර් මස 31 වන දිනට
මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

ශ්‍රී.ලං.රු.

වත්කම්	සටහන	2020	2019
ජංගම වත්කම්			
මුදල් සහ බැංකු හා සමාන දෑ	1	21,237,923	15,331,106
ලැබිය යුතු මුදල්	2	3,847,777	5,384,507
තොග	3	9,870,402	18,920,673
පෙර ගෙවුම්	4	220,332	499,486
කාර්ය මණ්ඩල ණය	5	13,033,855	13,348,925
ඇප තැන්පතු	6	112,500	227,990
වෙනත් අත්තිකාරම්	7	15,000	266,523
ස්ථාවර තැන්පතු	8	3,782,000	3,782,000
		52,119,789	**57,761,210**
ජංගම නොවන වත්කම්			
දේපළ පිරියත හා උපකරණ	10	105,088,952	87,090,610
		105,088,952	**87,090,610**
මුළු වත්කම්		**157,208,741**	**144,851,820**
බැරකම්			
ජංගම බැරකම්			
ගෙවියයු තු මුදල්	9	2,332,210	1,754,405
උපචිත වියදම්	11	4,072,296	9,463,387
පොදු තැන්පතු		120,250	120,250
		6,524,756	**11,338,042**
ජංගම නොවන බැරකම්			
පාරිතෝෂික ප්‍රතිපාදන	12	62,517,801	55,514,057
අමු ද්‍රව්‍ය අරමුදල		18,766,069	18,766,069
		81,283,870	**74,280,126**
මුළු බැරකම්		**87,808,626**	**85,618,168**
ශුද්ධ වත්කම්		**69,400,115**	**59,233,652**
ප්‍රාග්ධන දායක මුදල්		152,543,844	137,938,889
සමුච්චිත අරමුදල		(83,143,730)	(78,705,236)
මුළු ශුද්ධ වත්කම්/ස්කන්ධ		**69,400,115**	**59,233,653**

14, 15 වන පිටුවේ දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ 17 සිට 38 දක්වා පිටු වල දක්වා ඇති සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල අනුකල අංගයක් වන්නේය. මෙම මූල්‍ය ප්‍රකාශන මඟින් 2020.12.31 දිනට ජාතික ශිල්ප සභාව පිළිබඳවත්, ඒකී දිනෙන් අවසන් වසරේ හිඟය පිළිබඳවත් සත්‍යවූ ද, සාධාරණවූ ද අදහසක් පිළිබිඹු වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය වගකිව යුතුය. මෙම මූල්‍ය ප්‍රකාශන අනුමත කරන ලද අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් මෙහි අත්සන් තබන ලදී.

…….
පී.ඩබ්. ඒස්. කුමාර
ගණකාධිකාරී
ජාතික ශිල්ප සභාව

…….
සී. ලියනගේ
අධ්‍යක්ෂ
ජාතික ශිල්ප සභාව

…….
අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
ජාතික ශිල්ප සභාව

…….
සභාපති
ජාතික ශිල්ප සභාව

ජාතික ශිල්ප සභාව
2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය කාර්සාධන ප්‍රකාශනය

ශ්‍රී.ලං.රු.

	සටහන	2020	2019
ආදායම			
භාණ්ඩාගාර ප්‍රදාන - පුණරාවර්තන	13	149,050,000	149,887,994
- සංවර්ධන	13	35,215,083	65,228,942
ශිල්ප ගම්මාන සංවර්ධනය - අමාත්‍යාංශ අරමුදල්	21	2,405,000	18,592,230
අමුද්‍රව්‍ය වෙළඳ ගිණුමෙන් මාරුකළ විකුණුම් පිරිවැය ඉක්මවූ විකුණුම් ආදායම්	14	(854,639)	1,210,068
වෙනත් ආදායම්	15	953,735	1,683,665
වියදම මත ආදායම - ශිල්ප අරමුදල් ගිණුම	16	(805,187)	(1,193,567)
වියදම මත ආදායම - සුභසාධක ගිණුම	17	389,767	140,044
වියදම මත ආදායම - අනුග්‍රාහක ගිණුම	18	(3,600)	(158,184)
වියදම මත ආදායම - පුහුණු මධ්‍යස්ථාන ගිණුම	22	(37,725)	(207,522)
වර්ෂය සඳහා ප්‍රාග්ධන ප්‍රදාන ක්‍රමක්ෂය කිරීම		4,690,573	-
පෙර වර්ෂය සඳහා ප්‍රාග්ධන ප්‍රදාන ක්‍රමක්ෂය කිරීම		1,379,389	-
මුළු ආදායම		**192,382,396**	**235,183,670**
වියදම			
මෙහෙයුම් වියදම	19		
පුද්ගල වේතන		141,900,582	130,140,325
ගමන් වියදම		317,148	959,666
සැපයුම් හා භාවිත කළ පාරිභෝජ්‍ය ද්‍රව්‍ය		3,016,071	3,641,133
නඩත්තු		3,753,421	3,702,238
කොන්ත්‍රාත්ගත සේවා		3,707,619	3,221,585
වෙනත් වියදම්		5,382,247	5,433,228
ක්ෂය කිරීම්		4,690,573	4,986,962
සංවර්ධන වියදම්			
ශිල්ප සංවර්ධන හා සුභසාධන වියදම්	20	28,530,878	66,056,040
ශිල්ප ගම්මාන සංවර්ධන - අමාත්‍යාංශ අරමුදල්	21	2,405,000	17,730,526
මුළු වියදම		**193,703,538**	**235,871,703**
